## 136 – ඔබට පුදමි

ඔබට පුදමි ලොවේ සියලු සාර ජීවිතේ
ගසේ ගෙඩිද වලේ මල්ද ගොයම හා කෙතේ
විලෙන් විලෙට ගලා බසින ජීවනයේ ජලේ
සියලු ඉසුරු රඳා තිබෙන ගබේ ලෝ තලේ

කසුන් අසුන් තනා සඳුන් අඳුන් අනා
සුගන්ද දුම් උනා වඳිමි සදාණනේ

මුහුදෙ මසුන් වනේ සතුන් අහසෙ තරු එළි
ගඟෙ දොළේ කඩා හැලෙන පළිඟු දිය ඇලි
කැලය සුවඳ කෙරෙන මල් ද අතු ද කොළ දළු
උදේ ඉරෙන් රතට හැරෙන දහර අහු මුලු